# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි තෙවන පරීක්ෂණය (බාහිර) - 2019

2023 දෙසැම්බර්

**සමාජීය විද්‍යා පීඨය**

**ඉතිහාසය (නව/පැරණි නිර්දේශය)**

**ශ්‍රී ලංකාවේ ඉතිහාසය: ක්‍රි.ව. 1594 සිට 1972 දක්වා HIST – E 3015**

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි. කාලය : පැය 03 යි.

---

01. පරමාර්ථ හා ක්‍රමවේදය පිළිබඳව පරීක්ෂා කරමින් පෘතුගීසීන් ලංකාවේදී සිය ආගමික හා අධ්‍යාපනික කටයුතු පවත්වාගෙන ගිය ආකාරය පැහැදිලි කරන්න.

02. '1766 ගිවිසුම තුළින් ලන්දේසීන් හමුවේ පැවති විවිධ ආර්ථික හා දේශපාලනික ගැටලුවලට විසඳුම් ලැබිණ.' විමසන්න.

03. උඩරට රාජ්‍යයේ නායක්කර්වංශික පාලකයන්ගේ දේශපාලනික හා ආගමික කටයුතු පිළිබඳ පරීක්ෂා කරන්න.

04. 1796 සිට 1815 දක්වා කාලය තුළ බ්‍රිතාන්‍යයන් මෙරට සිය බලය ස්ථාපිත කිරීම සඳහා අනුගමනය කළ ක්‍රියාමාර්ග කවරේදැයි විමසන්න.

05. කෝල්බෲක් කොමිසම පත්කර එවීමට තුඩුදුන් ප්‍රධාන සාධක සැකෙවින් දක්වා කොමිසම මගින් නිර්දේශ කළ ආර්ථික හා පරිපාලන ප්‍රතිසංස්කරණ පිළිබඳ ඇගැයීමක් කරන්න.

06. 1848 ජනතා නැගීසිටීමට හේතු වූයේ ටොරිංටන් ආණ්ඩුකාරවරයා විසින් පනවන ලද බදු ප්‍රතිපත්තිය පමණක්ම ද? නිදසුන් සහිතව විමසන්න.

07. 1910 සිට 1924 දක්වා කාලය තුළ ක්‍රියාත්මක කරන ලද ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණවල දක්නට ලැබෙන විශේෂතා පෙන්වා දෙන්න.

08. 1919 ලංකා ජාතික සංගමය පිහිටුවීමට පසුබිම් වූ තත්ත්වය පරීක්ෂා කරන්න.

09. ඩොනමෝර් ආණ්ඩුක්‍රමය යටතේ අධ්‍යාපනය සම්බන්ධයෙන් හඳුන්වා දුන් ප්‍රතිසංස්කරණ පැහැදිලි කරන්න.

10. 1956 දී ඇති වූ දේශපාලන පරිවර්තනයට පසුබිම් වූ සාධක සාකච්ඡා කරන්න.

******************************